**පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය - 2023 ජනවාරි 01 දින සිට 2023 සැප්තැම්බර් 30 දක්වා**

---

පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ 2023 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අන්තර්ජාතික සංවර්ධන සංගමය අතර 2015 ඔක්තෝබර් 23 දින එළඹි අංක 5678 දරණ මූල්‍ය ගිවිසුමේ උපලේඛන 2 හි II කොටසේ ඇ (3) වගන්තියේ සඳහන් විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

මූල්‍ය ගිවිසුමට අනුව, කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර එහි කටයුතු වැවිලි මානව සංවර්ධන භාරය හරහා ක්‍රියාත්මක කරනු ලැබේ. ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ මුල් ළමාවිය සංවර්ධන සේවාවල සාධාරණ ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ගුණාත්මක බව වැඩිදියුණු කිරීමයි. මුල් ළමාවිය සංවර්ධන සේවා සැපයීම පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය**,** අධීක්ෂණය සහ ඇගයීම යනාදී සංරචක 02ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. මූල්‍ය ගිවිසුමට අනුව**,** ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 7,250 කට සමාන එ.ජ.ඩො. මිලියන 50 ක් වූ අතර සම්පූර්ණ මුදල අන්තර්ජාතික සංවර්ධන සංගමය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 මාර්තු 01 දින ආරම්භ කර තිබුණු අතර 2021 ජුනි 30 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2022 දෙසැම්බර් 30 දක්වා දීර්ඝ කර නැවත 2023 ජුනි 15 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

2023 සැප්තැම්බර් 30 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්ය සාධනය

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නර්දේශය |
| --- | --- | --- |
| 2023 සැප්තැම්බර් 30 දිනට ව්‍යාපෘතිය මගින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සහ එහි කාර්යසාධනය සියයට 65 සිට 88 දක්වා පරාසයක පැවතුනි. එ් පිළිබඳ විස්තර පහත දැක්වේ. | අපේක්ෂිත භෞතික කාර්ය සාධනයේ ප්‍රතිශතයක් ලෙස සාක්ෂාත් කර ගත් කාර්ය සාධනය ඉහළ මට්ටමක තිබුණි. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගත යුතුය. |

| | සංරචකය | ඉලක්කය | ජයග්‍රහණ | ජයග්‍රහණ ප්‍රතිශතයක් ලෙස (%) |
| --- | --- | --- | --- | --- |
| අ) | උපකාරක ගාස්තු ලබන ළමුන් සංඛ්‍යාව | ළමුන් 91,000 | 57,778 | 65 |
| ආ) | විනාශ වූ ප්‍රදේවල /සේවා සහ පහසුකම් අඩු ප්‍රදේශවල මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම | මධ්‍යස්ථාන 186 | 155 | 85 |
| ඇ) | මුල් ළමාවිය සංවර්ධන (ECD) උදෑසන ආහාර වැඩසටහන | ළමුන් 155,000 | 109,597 | 71 |
| ඈ) | සම්පත් මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම හෝ ඉදිකිරීම | මධ්‍යස්ථාන 9 | 7 | 77 |
| ඉ) | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන මගින් පහසුකම් වැඩිදියුණු කිරීමේ ප්‍රදාන ලබා ගැනීම | මධ්‍යස්ථාන 7,500 | 6,637 | 88 |

## 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා භාවිත කළ රු. මිලියන 18 ක් වූ වත්කම් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය සහ වැවිලි මානව සම්පත් භාරය වෙත පවරා තිබුණ ද, විගණනය සඳහා ඉදිරිපත් කර ඇති සහතිකය අනුව, ඒවා වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට නොහැකි විය. | අමාත්‍යාංශයට භාරදෙන වත්කම් අවශ්‍යතාව පරිදි ආයතන හා අංශ අතර බෙදා හැරේ. | වත්කම් විධිමත් ලෙස පැවරිය යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය 2023 සැප්තැම්බර් 30 දිනට අවසන් කළ බවට මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ ද, ව්‍යාපෘතියේ බැංකු ගිණුම තුළින් රු. 526,629ක ගනුදෙනු සිදුවී ඇත. | උදෑසන ආහාරය සැපයීම සඳහා ලබා දුන් අත්තිකාරම්වලින් රු.529,985 ක හිඟ අත්තිකාරමක් පැවතුණි. ඇතැම් පෙර පාසල්වලින් අත්තිකාරම් පියවීමේදී, ගෙවීම් අතිරික්තයක් සිදු වූ අතර, එම අතිරික්ත මුදල් පියවා නොගත් පෙර පාසල්වල අත්තිකාරම් පියවීමට යොදවා ඇත. ව්‍යාපෘතිය ඇවර කිරීමෙන් පසු ව්‍යාපෘතියේ බැංකු ගිණුමට බැර කරන මුදල් නැවත රජයේ ආදායමට බැර කෙරේ. | අත්තිකාරම් නිවැරදිව පියවිය යුතුය. |